# 6 ශ්‍රේණිය

# තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

කියවීම් ද්‍රව්‍ය




## ඒකකය 3

## මෙහෙයුම් පද්ධති හා ගොනු හැසිරවීම




## ගොනු හැසිරවීම

# ගොනුවක් යනු ?

- පරිගණකයේ වූ විවිධ ආකාරයේ දත්ත, තැන්පත්කර තබා ගැනීමට යොදාගනු ලබන ක්‍රමවේදයකි.
- පරිගණකයක විවිධ අකාරයේ ගොනු දක්නට ලැබේ.
- ගොනුවක් පෙන්නුම් කිරීමට සුවිශේෂී වූ සංකේක (Icons) යොදා ගනී.
    - හඬ ගොනු
    - පින්තූර ගොනු
    - ලේඛන ගොනු
    - වීඩියෝ ගොනු
    - පාඨ ගොනු
    - ධාවනය කළ හැකි ගොනු




## ගොනු කළමණාකරණය

- ගොනු ක්‍රමවත්ව කළමණාකරණය සඳහා දත්ත ගොනුවල සුරැකීම සිදුකර, එම ගොනු ගොනු බහාලුම් තුළ ගබඩා කරනු ලබයි.
- ගොනු කළමණාකරණය කිරීම සඳහා මෙහෙයුම් පද්ධතියක් මගින් පහත සේවාවන් ඉටු කරයි.
    - නව ගොනු නිර්මාණය කිරීම හා ඒවා සුදුසු ස්ථානවල සුරැකීම.
    - අනවශ්‍ය ගොනු මකා දැමීම.
    - ගොනු බහාලුම් අනුපිළිවෙලින් සැකසීම හා මකා දැමීම.
    - නම වෙනස් කිරීම.
    - ගබඩා කර ඇති ස්ථානය වෙනස් කිරීම.
    - උපස්ථ සෑදීම.

# ගොනුවක කොටස්

- ගොනුවක් කොටස් දෙකකින් සැදී ඇත.




# වැඩ කවුලුව (Working Window)

- අප විසින් පරිගණකයේ මෘදුකාංගයක් විවෘත කළ පසුව වැඩ කවුලුව දිස්වේ.
- වැඩ කවුලුවක් උපරිම කිරීම (Maximize), අවම කිරීම (Minimize), ප්‍රතිප්‍රාමාණය කිරීම (Resize), හා වසා දැමීම (Close) සිදු කළ හැකි ය.



# ගොනු බහාලුමක් (Folder) යනු ?

- පරිගණකයේ වූ විවිධ ආකාරයේ ගොනු, තැන්පත්කර තබා ගැනීමට යොදාගනු ලබන ක්‍රමවේදයකි.
- ගොනු බහාලුමක් සදහා නමක් පවතී.
- එය නම් කිරීමේ දී ; < > වැනි සංකේත භාවිත කළ නොහැක.




# ගොනුවක් නිර්මාණය කිරීම (Create)

- පරිගණකයේ වූ විවිධ ආකාරයේ යෙදුම් මෘදුකාංග (Application Software) ආධාරයෙන් ගොනුවක් නිර්මාණය කළ හැකිය .

## ගොනු හා ගොනු බහාලුම් (Files & Folders) මෙහෙයුම් කිහිපයක් පහත දැක්වේ.

1. **ෆෝල්ඩරයක් නිර්මාණය කිරීම. (Create)**
   - ෆෝල්ඩරය සෑදිය යුතු ධාවකය තෝරන්න.
   - File → New → Folder තෝරන්න.
   - සුදුසු ෆෝල්ඩර නාමයක් ලබාදෙන්න.

**2. ගොනු හා ෆෝල්ඩර කැපීම හා ඇලවීම. (Cut & Paste)**

- අදාළ ගොනුව/ෆෝල්ඩරය තෝරන්න.
- Cut විධානය තෝරන්න.
- ඇලවිය යුතු (Paste) ස්ථානය තෝරන්න.
- Paste විධානය තෝරන්න. (Ctrl+V)

**3. ගොනුවල හා ෆෝල්ඩරවල නම් වෙනස් කිරීම. (Rename)**

- නම වෙනස් කළ යුතු ගොනුව/ෆෝල්ඩරය තෝරන්න.
- Rename විධානය ලබාදෙන්න.
- ලබාදිය යුතු නම ලබාදී Enter ක්‍රියාත්මක කරන්න.

**4. ගොනු හා ෆෝල්ඩර මැකීම. (Delete)**

- මැකිය යුතු ගොනුව/ෆෝල්ඩරය තෝරන්න.
- Delete විධානය ලබාදෙන්න.

**5. මකන ලද ගොනුව හා ෆෝල්ඩරය නැවත ස්ථාපිත කිරීම. (Restore)**

- Recycle Bin විවෘත කරන්න.
- Restore කළ යුතු ගොනුව හා ෆෝල්ඩරය තෝරන්න.
- Restore විධානය ලබාදෙන්න.